# සමාගම් ගිණුම්කරණය - අතිරේක ප්‍රශ්න

# අභ්‍යාසය 137

**සිමාසහිත අසේනි (පෞද්ගලික) සමාගමේ** 2019 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත දී ඇත:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 2,000,000) | | 108,000 |
| 2018 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 25,600 |
| 12% ණයකර | | 40,000 |
| ඉඩම සහ ගොඩනැගිලි - පිරිවැයට (ඉඩම - රු. මිලියන 20) | 100,000 | |
| මෝටර් වාහන - පිරිවැයට | 75,000 | |
| 2018 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 32,000 |
| මෝටර් වාහන | | 30,000 |
| 2019 මාර්තු 31 දිනට තොගය - පිරිවැයට | 184,900 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 74,300 | |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 14,730 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 162,300 |
| 2018 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 1,800 |
| විකුණුම් | | 839,780 |
| විකුණුම් පිරිවැය | 641,350 | |
| බෙදාහැරීමේ වියදම් | 43,600 | |
| විදුලිය සහ ජලය | 12,200 | |
| අධ්‍යක්ෂක ගාස්තු | 12,000 | |
| කාර්යාල මණ්ඩල වැටුප් | 35,800 | |
| මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | 3,700 | |
| දුරකතන ගාස්තු | 2,800 | |
| වාහන නඩත්තු වියදම් | 3,300 | |
| විගණන ගාස්තු | 1,100 | |
| වෙනත් පරිපාලන වියදම් | 8,200 | |
| සාමාන්‍ය කොටස් සඳහා ගෙවූ අතුරු ලාභාංශ | 18,500 | |
| ගෙවූ ණයකර පොලී | 2,400 | |
| 2018 අප්‍රේල් 01 දිනට ආදායම් බදු වෙන්කිරීම | | 12,700 |
| ගෙවූ ආදායම් බදු | 18,300 | |
| **එකතුව** | **1,252,180** | **1,252,180** |

පහත සඳහන් අතිරේක තොරතුරුද සපයා ඇත:

(1) 2019 මාර්තු 31 දිනට පැවති තොගයේ ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV)] රු.184,200,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කරන ලදි.

(2) සමාගම වෙත රු.2,300,000/- ක් ගෙවීමට තිබූ ගනුදෙනුකරුවෙකු 2019 ජූලි 20 දින බුන්වත්භාවයට ප්‍රකාශ කරන ලද අතර, එම ලැබිය යුතු මුදල අයකරගත නොහැකි තත්ත්වයට පත්විය. තවද, වර්ෂය අවසානයේ ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 5% ක් වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය වශයෙන් පවත්වාගත යුතු බවට තීරණය කරන ලදි.

(3) පහත සඳහන් උපචිත සහ කලින් ගෙවූ වියදම් 2019 මාර්තු 31 දිනට ගිණුම්ගත කළ යුතු වේ:

| | | |
|---|---|---|
| කලින් ගෙවූ වාහන නඩත්තු වියදම් | : | රු.200,000/- |
| උපචිත විදුලිය | : | රු.100,000/- |

(4) ගොඩනැගිලි සහ මෝටර් වාහන, පිරිවැය මත සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය කරන අතර, වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය පහත පරිදි ඇස්තමේන්තු කර තිබේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂ 20 |
| මෝටර් වාහන | : | වර්ෂ 10 |

(5) 2017/18 වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු.13,300,000/- ක් වූ අතර, සම්පූර්ණ මුදලම වර්ෂය තුළදී ගෙවා දමන ලදි. 2018/19 තක්සේරු වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු.11,500,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(6) 2018 අප්‍රේල් 01 දින, සමාගම එකක් රු.1,000/- බැගින් වූ 12% ණයකර 40,000 ක් නිකුත් කරන ලදි. ණයකර මත පොලිය වර්ෂයකට දෙවතාවක් (biannually) ගෙවිය යුතු වේ.

(7) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2019 ජූලි 31 දින අනුමත කරන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත අසේනි (පෞද්ගලික) සමාගමේ,** කළමනාකාරීත්වයේ භාවිතය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ/ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 13)

(b) 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 12)

(මුළු ලකුණු 25)

## අභ්‍යාසය 138

**සීමාසහිත විසයින් මාට් (පෞද්ගලික) සමාගමේ** 2019 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත දී ඇත:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 1,000,000) | | 10,000 |
| 2018 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 12,550 |
| ණයකර | | 10,000 |
| යන්ත්‍ර, පිරිවැයට | 6,000 | |
| මෝටර් වාහන, පිරිවැයට | 4,000 | |
| කාර්යාල උපකරණ, පිරිවැයට | 2,000 | |
| 2018 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| යන්ත්‍ර | | 3,600 |
| මෝටර් වාහන | | 2,000 |
| කාර්යාල උපකරණ | | 1,000 |
| 2019 මාර්තු 31 දිනට තොගය | 10,200 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 17,150 | |
| 2019 මාර්තු 31 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා දීමනාව | | 430 |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 12,690 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 4,400 |
| 2018 අප්‍රේල් 01 දිනට, ආදායම් බදු ප්‍රතිපාදනය | | 40 |
| සාමාන්‍ය කොටස් සඳහා අතුරු ලාභාංශ | 4,000 | |
| විකුණුම් | | 46,000 |
| විකුණුම් පිරිවැය | 28,200 | |
| පරිපාලන වියදම් | 3,630 | |
| බෙදාහැරීමේ වියදම් | 1,600 | |
| මූල්‍ය වියදම් | 500 | |
| ගෙවූ ආදායම් බදු | 50 | |
| | **90,020** | **90,020** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය කළ යුතුව ඇත. වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| යන්ත්‍ර | : | වර්ෂ 5 |
| මෝටර් වාහන | : | වර්ෂ 4 |
| කාර්යාල උපකරණ | : | වර්ෂ 5 |

(2) 2019 මාර්තු 31 දිනට පහත සඳහන් ගනුදෙනු ගිණුම් පොත්වල වාර්තා කළ යුතු වේ:

| | | |
|---|---|---|
| ගෙවිය යුතු බදු කුලිය | : | රු.40,000/- |
| ඉදිරියට ගෙවූ රක්ෂණ වියදම් | : | රු.70,000/- |

(3) 2019 ජනවාරි 01 දින, සමාගම, 15% ණයකර 100,000 ක් එකක් රු.100/- බැගින් නිකුත් කරන ලද අතර, ණයකර සඳහා වූ පොලිය කාර්තුමය වශයෙන් ගෙවිය යුතු වේ. පළමු කාර්තුවට අදාල පොලිය 2019 අප්‍රේල් 01 දින ගෙවිය යුතු වේ.

(4) 2018/19 තක්සේරු වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු.90,000/- ක් ලෙස ඇස්තමේන්තු ගණනය කර ඇත.

(5) සමාගමේ කලින් සේවයේ නියුක්තව සිටි සේවකයෙකු සමාගමේ නිෂ්පාදන කටයුතු සඳහා යොදාගන්නා රසායන ද්‍රව්‍යයක් ආසාධනය වීමෙන් තමා තුළ සොබ්‍ය ගැටළු පැන නැගී ඇති බවත්, ඒ හේතුවෙන් සමාගම විසින් ඔහු වෙත වන්දියක් ගෙවිය යුතු බවත් පවසමින් නඩුවක් ගොනුකර ඇත. නඩුවේ තීන්දුව 2019 මාර්තු 31 දින වනවිට ලබා දී නොමැති වුවත්, රු.500,000/- ක මුදලක් වන්දි ලෙස සේවකයාට ගෙවීමට සමාගමට සිදුවන බව සමාගමේ නීතිඥයන්ගේ මතය වී තිබේ.

(6) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා වන අනුමැතිය 2019 මැයි 31 දින ලබාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සිමාසහිත වීසයින් මාට් (පෞද්ගලික) සමාගමේ,** කළමනාකාරීත්වයේ භාවිතය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ/ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 11)

(b) 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 14)

(මුළු ලකුණු 25)

## අභ්‍යාසය 139

**සීමාසහිත හාසා (පෞද්ගලික) සමාගමේ** 2018 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත දී ඇත:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 500,000) | | 5,000 |
| 2017 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 7,325 |
| පොදු සංචිත | | 850 |
| කොටස් අයදුම්වලින් ලද මුදල් | | 2,400 |
| මෝටර් වාහන, පිරිවැයට | 32,500 | |
| කාර්යාල උපකරණ, පිරිවැයට | 2,000 | |
| 2017 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| මෝටර් වාහන | | 22,500 |
| කාර්යාල උපකරණ | | 1,600 |
| 2018 මාර්තු 31 දිනට තොගය | 6,615 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 8,220 | 1,350 |
| 2017 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා දීමනාව | | 57 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 3,190 | |
| 12% ණයකර | | 5,000 |
| ලාභාංශ ගෙවීම් - අතුරු සහ අවසාන | 375 | |
| විකුණුම් | | 47,125 |
| විකුණුම් පිරිවැය | 23,500 | |
| පරිපාලන වියදම් | 3,050 | |
| බෙදාහැරීමේ වියදම් | 2,047 | |
| ණයකර පොලී ගෙවීම් | 300 | |
| වෙනත් මූල්‍ය වියදම් | 210 | |
| මාස 6 ස්ථාවර තැන්පතු (2018 මාර්තු 31 දින ආයෝජනය කරන ලද) | 11,000 | |
| වර්ෂය සඳහා ආදායම් බදු (සම්පූර්ණයෙන් පියවූ) | 200 | |
| **එකතුව** | **93,207** | **93,207** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) මූල්‍ය පහසුකම් වැඩිකිරීම සඳහා, එහි ප්‍රකාශිත ප්‍රාග්ධනය වැඩිකරන ලෙස බැංකුව විසින් සමාගමෙන් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව, 2018 ජනවාරි 31 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නව කොටස් 200,000 ක්, කොටසක් රු.10/- බැගින් නිකුත් කරන ලදි. 2018 මාර්තු 01 දින වැඩිපුර ලැබුණු මුදල් ආපසු ගෙවීමටත් කොටස් විභජනය කිරීමටත් තීරණය කරන ලදි. කෙසේවෙතත්, කොටස් අයදුමේදී එකතු කරගත් මුදල් වාර්තාකිරීම හැර මෙයට අදාලව වෙනත් කිසිදු සටහනක් ගිණුම් පොත්වල වාර්තා කර නොතිබුණි.

(2) 2017 අප්‍රේල් 01 දින, සමාගම, විසින් එකක් රු.100/- බැගින් වූ 12% ණයකර 50,000 ක් නිකුත්කරන ලදි. පොලිය, වර්ෂයකට දෙවතාවක් (bi-annually), සෑම වර්ෂයකම අප්‍රේල් 01 දින හා ඔක්තෝම්බර් 01 දින ගෙවිය යුතුවේ.

(3) පුළුල් කිරීමේ වැඩසටහනක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම, නිෂ්පාදන ක්‍රියාවලිය දෙසට යොමුකිරීමට තීරණය කරන ලද අතර, ඒ අනුව සමාගම 2018 පෙබරවාරි 15 දින ණය පදනම මත රු.50,000,000/- ක් පිරිවැය වූ නව යන්ත්‍රයක් මිලදී ගත් අතර, 2018 මාර්තු 01 දින නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලදි. යන්ත්‍රයේ පිරිවැය සහ ස්ථාපිත කිරීමේ පිරිවැය වන රු.2,800,000/- ක මුදල 2018 අප්‍රේල් 15 දින පියවිය යුතු විය. කෙසේවෙතත්, මේ සම්බන්ධයෙන් ගිණුම් පොත්වල කිසිදු සටහනක් තබා නොතිබුණි.

(4) පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය කළ යුතුව ඇත. වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි ඇස්තමේන්තු කර තිබේ:

| | | |
|---|---|---|
| මෝටර් වාහන | : | වර්ෂ 05 |
| කාර්යාල උපකරණ | : | වර්ෂ 10 |
| යන්ත්‍ර | : | වර්ෂ 10 |

(5) 2018 මාර්තු 31 දිනට පහත සඳහන් උපචිත වියදම් සහ ඉදිරියට කළ ගෙවීම් ගිණුම් පොත්වල වාර්තා කළ යුතුව ඇත:

| | | |
|---|---|---|
| ගෙවිය යුතු කුලී | : | රු.45,000/- |
| ඉදිරියට ගෙවූ රක්ෂණ | : | රු.8,000/- |

(6) 2018 මාර්තු 31 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා දීමනාව රු.123,000/- ක් දක්වා වැඩි කිරීමට තීරණය කරන ලදි.

(7) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අනුමැතිය 2018 ජූනි 15 දින ලබාදෙන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත හාෂා (පෞද්ගලික) සමාගමේ,** කළමනාකාරීත්වයේ භාවිතය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ/ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 11)

(b) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 14)

(මුළු ලකුණු 25)

## අභ්‍යාසය 140

වෙළඳ ව්‍යාපාරයක යෙදී සිටින සමාගමක් වූ **සීමාසහිත ජය (පෞද්ගලික) සමාගමේ** 2018 මාර්තු 31 දිනට ගිණුම් පොත්වලින් උපුටාගත් ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 300,000) | | 45,000 |
| 2017 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | | 10,000 |
| ගෙවූ අතුරු ලාභාංශ | 2,500 | |
| 10% ණයකර | | 25,000 |
| ඉඩම් සහ ගොඩනැගිලි පිරිවැයට (ඉඩම් - රු. මිලියන 20) | 70,000 | |
| මෝටර් වාහන | 90,000 | |
| 2017 අප්‍රේල් 01 දිනට, සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 14,000 |
| මෝටර් වාහන | | 36,000 |
| 2018 මාර්තු 31 දිනට, තොගය | 55,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 45,500 | |
| 2017 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා දීමනාව | | 1,250 |
| ගෙවූ ආදායම් බදු | 2,650 | |
| විකුණුම් | | 368,000 |
| විකුණුම් පිරිවැය | 235,000 | |
| බෙදාහැරීමේ වියදම් | 15,000 | |
| පරිපාලන වියදම් | 43,000 | |
| ගෙවූ ණයකර පොලී | 1,250 | |
| අතැ'ති සහ බැංකුවේ මුදල් | 750 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 48,000 |
| අවිනිශ්චිත ගිණුම | | 11,000 |
| 2017 අප්‍රේල් 01 දිනට, ආදායම් බදු ප්‍රතිපාදනය | | 2,400 |
| | **560,650** | **560,650** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2018 මාර්තු 31 දිනට, අවසන් තොගය ගණන්කර, පිරිවැය මත ඇගයීම් කොට, ගිණුම් පොත්වලට ගෙන තිබුණි. 2018 අප්‍රේල් 20 දින සිදුකරන ලද සමාලෝචනයකදී හෙළිදරව් වූයේ රු.5,000,000/- ක් පිරිවැය වූ ඉහත කී තොගයෙන් කොටසක් යල්පැන ගිය තත්ත්වයට පත්වී ඇති බැවින් ඒවා 2018 අප්‍රේල් 30 දින රු.4,200,000/- කට විකිණීමට අපේක්ෂිත බවයි.

(2) 2017 අප්‍රේල් 01 දින, සමාගම එකක් රු.100/- බැගින් වූ 10% ණයකර 250,000 ක් නිකුත් කරන ලදි. ණයකර මත පොලිය වර්ෂයකට දෙවතාවක් (biannually) ගෙවිය යුතු වේ. වර්ෂය තුළදී ගෙවන ලද පොලිය ගෙවූ ණයකර පොලී ගිණුමට අයකර ඇත.

(3) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය කළ යුතුව ඇත. වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය පහත පරිදි ඇස්තමේන්තු කර තිබේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂ 25 |
| මෝටර් වාහන | : | වර්ෂ 10 |

වර්ෂය සඳහා වූ මුළු ක්ෂය, පරිපාලන වියදම්වලට හරකර අවිනිශ්චිත ගිණුමට බැරකොට ඇත.

(4) සමාගම වෙත රු.500,000/- ක් ගෙවීමට තිබූ ගනුදෙනුකරුවෙකු 2018 මැයි 05 දින මියගිය අතර, ඒ අනුව ඔහුගෙන් ලැබිය යුතු මුදල් අයකරගත නොහැකි තත්ත්වයට පත්විය. තවද, වර්ෂය අවසානයේදී ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 5% ක් වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා දීමනාව වශයෙන් පවත්වාගත යුතු බවද තීරණය කරන ලදි.

(5) පහත සඳහන් උපචිත සහ කලින් ගෙවූ වියදම්, 2018 මාර්තු 31 දිනට, ගිණුම්ගත කළ යුතු වේ:

| | රු. |
|---|---|
| උපචිත ගොඩනැගිලි නඩත්තු වියදම් | 400,000 |
| කලින් ගෙවූ ප්‍රචාරණ වියදම් | 150,000 |

(6) 2016/17 තක්සේරු වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම, රු.2,650,000/- ක් ලෙස අවසන් නිගමනයකට පැමිණි අතර, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සම්පූර්ණයෙන් පියවා දමන ලදි. ගෙවූ මුදල, ගෙවූ ආදායම් බදු ගිණුමට හරකර තිබේ. 2017/18 තක්සේරු වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු.2,800,000/- ක් වෙතැයි ඇස්තමේන්තුකර ඇත.

(7) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2018 ජූනි 30 දින අනුමත කරන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ජය (පෞද්ගලික) සමාගමේ,** කළමනාකරණයේ භාවිතය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ/ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 12)

(b) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 13)

(මුළු ලකුණු 25)